රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2021(III)

මගේ අංකය : EST-6/03/LEA/3381
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2021.07.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම

ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි එන්නත්කරණයට ලක්විය යුතු බහුතරයක එන්නත්කරණ කිරීම් කටයුතු අවසන්වෙමින් පවතින බැවින් හා රාජ්‍ය නිලධරයන් බහුතරයක් ද එන්නත්කරණයට ලක්කර ඇති බැවින් රජයේ කාර්යයන් බිඳවැටීමකින් තොරව සාමාන්‍ය පරිදි පවත්වා ගැනීමට ප්‍රමුඛතාව දිය යුතු බව ජනාධිපති ලේකම්ගේ අංක PS/RD-A1/07/06/02 හා 2021 ජූලි 29 දිනැති ලිපියෙන් උපදෙස් දී ඇත.

02. ඒ අනුව, රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට යටත්ව 2021.08.02 දින සිට සියලුම රාජ්‍ය සේවකයන් සාමාන්‍ය පරිදි රාජකාරි කටයුතු සඳහා වාර්තා කළ යුතු ය.

03. තව ද, ජනාධිපති ලේකම්ගේ ඉහත පළමු ඡේදයේ සඳහන් ලිපියෙන් ඔහු විසින් කොවිඩ් - 19 වෛරස් ව්‍යාප්තිය පාලනය පහසු කිරීම සඳහා සීමිත කාර්ය මණ්ඩල චක්‍රීය පදනම මත කැඳවමින් සහ නිවෙස්වල සිට රාජකාරි සිදු කිරීමට අදාළව නිකුත් කර ඇති පහත චක්‍රලේඛ විධිවිධාන සියල්ල ද 2021.07.31 දින දක්වා පමණක් බලාත්මක වන බව ද සඳහන් කර ඇත.

| | | | |
|---|---|---|---|
| 1 | 2020.03.19 | පීඑස්/සීඑස්ඒ/චක්‍රලේඛ/14/2020 | වසංගත රෝගී තත්ත්වයක් රට තුළ ව්‍යාප්ත වන අවස්ථාවක රාජ්‍ය යාන්ත්‍රණය අකර්මන්‍ය නොවී පවත්වාගෙන යාම |
| 2 | 2020.03.26 | පීඑස්/සීඑස්ඒ/චක්‍රලේඛ/17/2020 | COVID – 19 වසංගත තත්ත්වය රට තුළ ව්‍යාප්ත වීම පාලනය කිරීමේ දී රාජ්‍ය යාන්ත්‍රණය අකර්මන්‍ය නොවී පවත්වාගෙන යෑම |
| 3 | 2020.03.30 | පීඑස්/සීඑස්ඒ/චක්‍රලේඛ/18/2020 | ගෝලීය කොරෝනා වසංගත තත්ත්වය තුළ නිවසේ සිට රාජකාරි කටයුතු ඉටු කිරීමේ වැඩපිළිවෙළක් (WFH) මඟින් රජයේ සේවාවන් සැපයීම |

| | | | |
|---|---|---|---|
| 4 | 2020.03.30 | පීඑස්/සීඑස්ජ්/චක්‍රලේඛ/19/2020 | අඩු ආදායම්ලාභීන් සහ අවධානමට ලක්විය හැකි පවුල්/ පුද්ගල සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහනදායි මිලකට ලබාදීම |
| 5 | 2020.04.18 | PS/GPA/Circular/20/2020 | කොවිඩ් 19 වෛරසය පවතින කාලය අතරතුර සාමාන්‍ය දෛනික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා දිස්ත්‍රික්ක විවෘත කිරීමේ දී රාජ්‍ය ආයතන විසින් පිළිපැදිය යුතු මාර්ගෝපදේශ |
| 6 | 2020.05.14 | PS/GPA/Circular/21/2020 | කොවිඩ් 19 වසංගතය පවතින කාලය අතරතුර කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන්හි පිහිටා ඇති රාජ්‍ය ආයතන විසින් මෙහෙයුම් විමධ්‍යගතකරණය තුළින් රාජ්‍ය සේවාවන් ප්‍රශස්ත අයුරින් පවත්වා ගැනීම |
| 7 | 2020.10.29 | PS/GPA/Circular/33/2020 | ගෝලීය කොරෝනා වෛරස වසංගත තත්ත්වය පවතින අතරතුර දුරස්ථ රාජකාරි කටයුතු ඉටු කිරීමේ වැඩපිළිවෙළ |
| 8 | 2020.11.16 | PS/GPA/Circular/34/2020 | ජාතික මට්ටමින් කොවිඩ් 19 වෛරසය මැඩ පැවැත්වීම - "සුවෙන් සිටිමු" ඩිජිටල් විසඳුම |
| 9 | 2020.11.25 | PS/GPA/Circular/35/2020 | නිවෙස්ගත නිරෝධායනය නිරීක්ෂණය කිරීමේ යාන්ත්‍රණය |

04. එසේම කොවිඩ් - 19 වෛරස් ව්‍යාප්තිය පාලනය පහසු කිරීම සඳහා සීමිත කාර්ය මණ්ඩල චක්‍රීය පදනම මත කැඳවමින් සහ නිවෙස්වල සිට රාජකාරි සිදු කිරීමට අදාළව මා විසින් නිකුත් කර ඇති පහත චක්‍රලේඛ හා චක්‍රලේඛ ලිපියෙහි විධිවිධාන ද මෙයින් අවලංගු කෙරේ.

| | | | |
|---|---|---|---|
| 1 | 2020.04.29 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 01/2020 | කොවිඩ් - 19 වෛරසය පවතින කාලය තුළ රාජ්‍ය ආයතන විවෘත කරන කාර්යාලයීය කටයුතු ආරම්භ කිරීම සහ එම කටයුතු පවත්වාගෙන යාම |
| 2 | 2020.10.28 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2020 | රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම |
| 3 | 2021.03.05 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021 | රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම |
| 4 | 2021.04.27 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(I) | රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම |
| 5 | 2021.05.10 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(II) | රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම |

05. රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමේ දී රජයේ නිලධරයන් හා මහජනයාගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සපයනු ලබන සෞඛ්‍ය උපදෙස් තවදුරටත් එලෙසම අනුගමනය කළ යුතු ය. එහිදී විශේෂයෙන් ම පහත සෞඛ්‍ය උපදෙස් පිළිපැදිය යුතු ය.

(අ) දුරස්ථභාවය ආරක්ෂා කිරීම
(ආ) මුව ආවරණ පැළඳීම
(ඇ) දෑත් පිරිසිදු කිරීම

නිසි සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරමින් ආයතනික කාර්ය මණ්ඩලය මෙන්ම සේවාලාභීන් ද කොවිඩ් 19 වෛරසය ආසාදනය වීමෙන් වළක්වාගනිමින් සේවා සැපයීමේ වගකීම ආයතන ප්‍රධානීන් වෙත පැවරෙන බව ද අවධාරණය කෙරේ.

06. 2021.08.02 දින සිට රජයේ නිලධරයන්ගේ නිවාඩු සම්බන්ධයෙන් සාමාන්‍ය විධිවිධාන අනුගමනය කළ යුතු ය.

07. යම් රජයේ නිලධරයෙකු පවතින තත්ත්වය තුළ නිරෝධායන රෙගුලාසි යටතේ නිරෝධායනයට යොමු කර ඇත්නම් හා එසේ නිරෝධායනය සඳහා යොමු කර ඇත්තේ රජයේ නිරෝධායන නීති රීති උල්ලංඝනය කිරීමෙන් වන දඬුවමක් ලෙස නොවන්නේ නම් එවැනි නිලධරයන් සඳහා එම නිරෝධායන කාලසීමාව ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 12:9 උප වගන්තියෙහි විධිවිධාන පරිදි සම්පූර්ණ වැටුප් සහිත කාලසීමාවක් ලෙස සැලකිය යුතු ය.

08. මෙම චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර බලාත්මක වූ චක්‍රලේඛ විධිවිධාන අනුව රාජ්‍ය නිලධරයන් සේවයට කැඳවූ කාලසීමාව තුළ ඔවුන් ලබාගත් නිවාඩු ඔවුන්ගේ සේවය ස්ථිර කිරීම්, උසස්වීම් ලබාගැනීම හා විශ්‍රාම ගැන්වීම් කටයුතු සඳහා අදාළ කරගැනීම පිළිබඳව උපදෙස් ඉදිරියේ දී නිකුත් කරනු ලැබේ.

09. නිලධරයන්ට බාධාවකින් තොරව සේවයට වාර්තා කිරීමට හැකිවන පරිදි අදාළ බලධරයන් විසින් පොදු ප්‍රවාහන සේවා යථා පරිදි ක්‍රියාත්මක කරනු ඇත.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය